## "සුපිළිපන් බව වැඩිදියුණු කරමු – අල්ලස හා දූෂණය පිටුදකිමු"

## උතුරු මැද පළාත් ඩිජිටල් නිර්මාණ තරඟාවලිය - 2026

### තරග නීති හා කොන්දේසි

01. තරගයට ඉදිරිපත් කරන නිර්මාණය තරගකරුගේ/කණ්ඩායමේ මුල් නිර්මාණයක් විය යුතු අතර, වෙනත් තරගයකින් හෝ ප්‍රකාශිත මූලාශ්‍රයකින් අවසරයකින් තොරව පිටපත් නොකළ යුතුය.
02. DSLR (Full HD) සහ Smart Phone (සුහුරු ජංගම දුරකතන) භාවිතයෙන් සිදු කරන නිර්මාණයන් සඳහා AI තාක්ෂණය යොදා ගත නොහැක.
03. කෘතිම බුද්ධි මෘදුකාංග (AI Creation Software, කෘතිම බුද්ධි තාක්ෂණික නිර්මාණ (AI Creations සඳහා පමණක් යොදා ගැනීමට අවසර ලැබේ.)
04. අන් අයගේ ඡායාරූප, හඬ, වීඩියෝ, සංගීතය, ලාංඡන හෝ වෙනත් කෘති භාවිත කරන විට අවශ්‍ය අවසර සහ බලපත්‍ර ලබාගත යුතුය.
05. පුද්ගලයන් හඳුනාගත හැකි ඡායාරූප/වීඩියෝ සඳහා අදාළ අනුමැතිය ලබාගත යුතුය. බාලවයස්කරුවන්ගේ දර්ශන සඳහා දෙමාපිය/භාරකරුගේ අවසරය අත්‍යවශ්‍ය වේ.
06. සත්‍ය පුද්ගලයන්ට හෝ ආයතනවලට එරෙහිව සාක්ෂි රහිත චෝදනා, අපහාසාත්මක ප්‍රකාශ හෝ පෞද්ගලික තොරතුරු ඇතුළත් නොකළ යුතුය. අවශ්‍ය නම් ප්‍රබන්ධ චරිත සහ අවස්ථා භාවිත කළ හැකිය.
07. නිර්මාණය අදාළ තේමාවට සම්බන්ධ විය යුතු අතර වෛරී, ප්‍රචණ්ඩ, වෙනස්කම් කරන හෝ නීතිවිරෝධී අන්තර්ගත ඇතුළත් නොවිය යුතුය.
08. නිර්මාණයේ භාෂාව සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි විය හැකිය.
09. ජයග්‍රාහී නිර්මාණ ප්‍රචාරණ කටයුතු සඳහා භාවිත කිරීමට අභ්‍යන්තර කටයුතු ඒකකය තීරණය කරන්නේ නම්, (නිර්මාණකරුගේ අයිතිය රැකෙන පරිදි) භාවිත අරමුණ සහ අවසරය ලිඛිතව ලබා දීමට කටයුතු කළ යුතුය.
10. මෙම තරගය සඳහා ඕනේම ඉසව්වකින් නිර්මාණ ඉදිරිපත් කළ හැකි අතර, එක් නිර්මානකරු හෝ කණ්ඩායම විසින් තරග ඉසව් 3ක් සඳහා පමණක් නිර්මාණය ඉදිරිපත් කළ හැකිය.
11. තරගය සඳහා ඉදිරිපත් කරන නිර්මාණය නීතිමය ගැටලුකාරී අන්දමෙන් හෝ පවතින නීතිමය තත්වයන්ට පටහැනි ආකාරයෙන් ඉදිරිපත් නොකළ යුතුය. නීතිමය තත්වයතට මුහුණදීමට සිදුවුවහොත් උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර කටයුතු ඒකකය වග කියනු නොලබයි.
12. නිර්මාණය 2026.11.30 පෙර ලැබෙන පරිදි ප්‍රධාන ලේකම් කාර්යාලයේ නිල වෙබ් අඩවියේ අභ්‍යන්තර කටයුතු ඒකකය විසින් පළ කර ඇති දැන්වීමට අනුකූලව ලබා දිමට කටයුතු කළ යුතුය.
13. ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ හෝ නියමයන්ට නොගැළපෙන ඉදිරිපත් කිරීම් කිසිදු දැනුම් දීමකින් තොරව තරග ඉසව්වෙන් ඉවත්කරනු ලබයි.

අභ්‍යන්තර කටයුතු ඒකකය,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු මැද පළාත - අනුරාධපුර.
2026.10.19